**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සිව්වන වසර පරීක්ෂණය**

**පළමු සෙමෙස්තරය 2019/2020**

**SLG 4173 – විශ්ව සාහිත්‍ය පරිචය**

---

තෝරාගත් ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය - පැ දෙකයි (02) යි.

1. "විශ්ව සාහිත්‍ය හැදෑරීම ඔස්සේ අත් කර ගත හැකි වැදගත් හා විශිෂ්ට ඥානමය සම්පත වන්නේ මනුෂ්‍යත්වය විෂයෙහි ගතානුගතික දෘෂ්ටිවාදවලින් වියුක්තව මානව ජීවිතය පිළිබඳ යථාවබෝධය ලැබීමය." මේ කියමන නිදසුන් ආශ්‍රයෙන් විග්‍රහ කරන්න.

2. "කාලය, දේශය හෝ යුගය අතික්‍රමණය කරමින් විවාහය නම් වූ සංස්ථාව සම්බන්ධයෙන් සනාතන අගයකින් යුක්ත ජීවිත විවරණයක් හෙන්රික් ඉබ්සන් සිය සෙල්ලම් ගෙය නාට්‍යයෙන් සිදු කර ඇත." මෙවැනි නිගමනයකට එළඹීමට ඉවහල් වන සාධක මොනවාදැයි පෙන්වා දෙන්න.

3. "මනුෂ්‍ය ජීවිතවල ඉරණම විසඳෙන අන්දම යම් අවකාශයක ශෝචනීය වන්නේ අතීත උරුමයන් ද ජීවන ලාලසාවන් ද අතර පරතරය හා සට්ටනය එකිනෙකට ප්‍රතිවිරුද්ධව නැඟී සිටින බැවිනි. ගුස්ටාව් ප්ලොබෙයා, එමාගේ හා චාල්ස්ගේ චරිත ආශ්‍රයෙන් මේ ධර්මතාව මනරම්ව නිරූපණය කර තිබේ." සාකච්ඡා කරන්න.

4. ආදරය මෙන්ම මනුෂ්‍යත්වය සුපුෂ්පිත වන්නේ මිනිසා සොබා දහමට එරෙහිව කටයුතු නොකරන විටය යන හැඟීම විභූතිභූෂණ බන්දෝපාධ්‍යායගේ අරණකට පෙම්බැඳ නම් වූ රමණීය ගද්‍ය කාව්‍යයෙන් කුළු ගැන්වෙයි. ඔබේ අදහස් දක්වන්න.

5. "තත්කාලීන සමාජාර්ථික ක්‍රියාවලිය සහ රුසියානු පොදු ජනයා අතර වූ අනවරත අරගලය රුසියානු සාහිත්‍යයෙහි පොදු තේමාව විය." සම්භාව්‍ය රුසියානු කෙටිකතා සංග්‍රහය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

6. "චිනුවා අචෙබෙ විසින් රචනා කරන ලද මුහුද ගොඩගලා නවකතාව, යටත්විජිතවාදියා සහ යටත් වැසියා අතර වූ සංස්කෘතික ගැටුමෙහි ප්‍රකාශනයකි. විමසන්න.